


# එංගලන්ත පාපන්දුවේ අනාගතය ස්ටීව් මැක්ලරන් භාරයට

**කසුන් සේනාරත්න**

**පාපන්දු** ක්‍රීඩාවද බොහෝ ක්‍රීඩාවන් ලෝකයට හඳුන්වා දුන් එංගලන්තයේම නිර්මාණයකි. එහෙත් බොහෝවිට ඔවුන් හඳුන්වා දුන් ක්‍රීඩාවන් තුළින් වැඩි දස්කම් දක්වන්නේ වෙනත් රටවල් නියෝජනය කළ කණ්ඩායම් හා ක්‍රීඩකයින් වීම පාපන්දු ක්‍රීඩාවටද පොදු ධර්මතාවයක් වී ඇත.

එංගලන්ත ලෝකයට ක්‍රිකට් හඳුන්වා දුන්නද ලොව පැවති පළමු ටෙස්ට් ක්‍රිකට් තරගයේදී ඔවුන් ඕස්ට්‍රේලියානුවන් හමුවේ පරාජයට පත්වී තිබුණි. එසේම 1975 වසරේ සිට මේ දක්වා ක්‍රිකට් වෙනුවෙන් ලෝක කුසලාන තරගමාලා 8 ක් පවත්වා ඇතත් තවමත් එංගලන්තයට එක අවස්ථාවක හෝ ලෝක කුසලාන දිනා ගන්නට හැකි වී නැත.
එංගලන්තයේ පාපන්දුව පිළිබඳවද සඳහන් කළ හැක්කේ එවැනිම ප්‍රකාශයකි. 1930 වසරේ සිට මෙතෙක් පැවති ලෝක කුසලාන පාපන්දු තරගමාලා අතුරින් ඔවුන් ජයග්‍රහණය කර ඇත්තේ 1966 වසරේදී පමණකි.
කෙසේ නමුත් ඉතාලියට සිව්වැනි වරටත් ලෝක කුසලාන හිමිකර දෙමින් පසුගියදා ජර්මනියේදී නිමාව දුටු ලෝක කුසලාන පාපන්දු තරගාවලියට එංගලන්තයෙන් ඉදිරිපත් කර තිබූ කණ්ඩායම දෙස බැලූ බොහෝ විචාරකයින් පවසා තිබුණේ මෙවර එංගලන්තය එහි ශූරතාව සඳහා ඉතා ආසන්නව සිටින බවකි.
මෑත කාලයේ ජගත් පාපන්දු පිටියේ නම රැන්දූ ඩේවිඩ් බෙකම් නායකත්වය දුන් එංගලන්ත පිලට මයිකල් ඕවන්, ඇෂ්ලි කෝල් ෆ්‍රෑන්ක් ලැම්පාඩ්, රියෝ ෆර්ඩිනන්ඩ්, වේන් රූනි හා ජෝන් කෝල් වැනි ප්‍රබල ක්‍රීඩකයින් රැසක්ම ඇතුළත්ව සිටීම එවැනි මතයක් ගොඩ නැගෙන්නට ඉවහල් වුවා විය හැකිය.
එහෙත් අර්ධ අවසන් පූර්ව වටයෙන් ඉදිරියට ගමන් කළ නොහැකි වූ එංගලන්ත පිලට මෙවරද ලෝක කුසලාන බලාපොරොත්තු දුන් කර ගනිමින් සියරට බලා යන්නට සිදුවී තිබුණි.
මේ වනවිට ලෝක කුසලාන පාපන්දු තරගාවලිය අවසන් වී මාස කිහිපයක් පමණ ගෙවී ගොස් ඇත. ඉතාලියට ලෝක කුසලානව හිමිකර දෙමින් සටහන් කළ ප්‍රතිඵලය දැනටමත් එම තරගාවලියට සහභාගි වූ බොහෝ කණ්ඩායම්වල වෙනස්කම් ඇති කරන්නට තරම් බලපෑම් එල්ල කර ඇති බවක් දක්නට ඇත.
පෘතුගාලය හමුවේ පරාජය වීමත් සමග නැවත සියරට බලා ගිය එංගලන්ත පිලේ නායකත්වයෙන් ඩේවිඩ් බෙකම් මේ වනවිට ඉල්ලා අස්වී අවසන්ය. එසේම කණ්ඩායමේ නියමුවා වූ ස්වෙන් ගෝරාජ් එරික්සන්ද එංගලන්ත පිල හැර ගොසිනි.
එසේ වුවද එංගලන්තයට පාපන්දුව අවශ්‍යය. ඒ සඳහා ක්‍රීඩකයින්, පුහුණුකරුවන් කළමණාකරුවන් හා පරිපාලන නිලධාරීන්ද සිටිය යුතුය.
එබැවින් ඉවත් වන්නන් වෙනුවට වෙනත් අය පත්කර ගැනීමද අනිවාර්‍යයෙන්ම කළ යුත්තකි. ස්ටීව් මැක්ලරන් නැමැත්තා එංගලන්ත පාපන්දුව හා සම්බන්ධ වන්නේ ඉහත සඳහන් කළ පරිදි ඇති වූ එක් පුරප්පාඩුවක් පිරවීම සඳහාය.
එංගලන්ත පිල හැර ගිය ස්වේන් ශෝරාන් එරික්සන්ගේ ස්ථානයට පැමිණ මැක්ලරන්ට දැන් එංගලන්ත පිල පුහුණු කිරීමේ වගකීම පැවරී ඇත. කෙසේ වුවත් ජර්මනියේ පැවති ලෝක කුසලාන පාපන්දු තරගාවලියේදී අසාර්ථක වූ එංගලන්ත පාපන්දු කණ්ඩායමේ කළමණාකරු වශයෙන් එවකට පුහුණුකරු ලෙස කටයුතු කළ එරික්සන්ගේ දකුණු අත ලෙස සිටි 45 හැවිරිදි මැක්ලරන් දැන් ඒ තම හිතවතාට බැරි වූ දේ කරන්නට වැඩ භාරගෙන සිටියි.

වෘත්තීය පාපන්දු ක්‍රීඩකයකු ලෙස හල්සිටි ඩර්යි කවුන්ටි, ලින්කොන් සිටි, බ්‍රිස්ටල් සිටි හා ඔක්ස්ෆර්ඩ් යුනයිටඩ් යන පාපන්දු කණ්ඩායම් නියෝජනය කරමින් මැදපෙළ ක්‍රීඩකයෙකු ලෙස දස්කම් දක්වා තිබූ මැක්ලරන්ගේ පාසල් අවදියේ වඩාත්ම උනන්දුවක්

*එංගලන්ත ලෝකයට ක්‍රිකට් හඳුන්වා දුන්නද ලොව පැවති පළමු ටෙස්ට් ක්‍රිකට් තරගයේදී ඔවුන් ඕස්ට්‍රේලියානුවන් හමුවේ පරාජයට පත්වී තිබුණි.*

දැක්වූ ක්‍රීඩාව බවට පත්ව තිබුණේ පාපැදි ක්‍රීඩාවය.
පාසල් යෑම හා ඒම සඳහා දිනපතා සැතපුම් 10 ක් පමණ පාපැදියේ ගමන් කිරීම ඊට හේතුවුවා විය හැකිය. එහෙත් ඊට අමතරව ඔහු පියාගේ අඩි පාරේ යමින් ස්කෝෂ් ක්‍රීඩාවේද මහත් උනන්දුවකින් යුතුව නියැලී තිබුණි. ඒ හැර රගර් හා ටෙනිස්ද ඔහුගේ හිත දිනා ගත් තවත් ක්‍රීඩාවන් දෙකක් ලෙස සඳහන් කළ හැකිය.
එනමුත් හල්සිටි පාපන්දු කණ්ඩායමට ඔහු 16 හැවිරිදි වියේදී එක්වීමත් සමඟ අනෙකුත් ක්‍රීඩාවන් වෙත තිබූ මැක්ලරන්ගේ කැමැත්ත ටිකින් ටික දියවෙන්නට පටන් ගත්තේය.
කොහොම නමුත් පාපන්දු ක්‍රීඩාවට මැක්ලරන්ට නිතර නිතර ආබාධ ගෙන දුන්නේය. ඒ නිසා 1990 වසරේ ඔහුට තම පාපන්දු පාවහන් යුගල විවේක ගැන්වීමට සිදුවී තිබුණි.
ක්‍රීඩකයෙකු ලෙස පිටියේ රැඳී සිටිය නොහැකි වුවද පාපන්දු ක්‍රීඩාවට තිබූ කැමැත්ත මැක්ලරන් පාපන්දු පුහුණුකරුවකු බවට පත්කරනු ලැබීය. ඒ අනුව 1992 වසරේ ඔහු ඔක්ස්පර්ඩ් යුනයිටඩ් පිලේ අතිරේක පුහුණුකරු බවට පත්විය.
අනතුරුව 1995 වසරේදී ඔහු ඩර්බි කවුන්ටි පිලේ පළමු පිලේ ප්‍රධාන පුහුණුකරු ලෙස වැඩ භාරගෙන තිබුණි. ඉන්ද නොනැවතුණු මැක්ලරන් පාපන්දු කණ්ඩායම් භාර කළමණාකරු ලෙස කටයුතු කිරීමද ආරම්භ කරමින් 1999 වසරේ මැන්චෙස්ටර් යුනයිටඩ් පිලේ සහය කළමණාකරු ලෙස වැඩ භාර ගත්තේය.

පසුගිය ලෝක කුසලාන පාපන්දු තරගාවලිය ආසන්නයේ ඔහු එංගලන්ත පිලේ කළමණාකරු ලෙස පත් කරන්නට පෙර 2001 වසරේ සිටම මිඩ්ල් බ්‍රෝ පාපන්දු කණ්ඩායමේ කළමණාකරු ලෙස සේවය කර තිබුණි.
ඔහු මිඩ්ල් බ්‍රෝ පාපන්දු කණ්ඩායමට එක්වීමත් සමඟ එම කණ්ඩායමේ සීඝ්‍ර දියුණුවක් දක්නට විය. 2001 වසරේ එෆ්.ඒ. කුසලාන තරගාවලිය අවසන් පූර්ව තරගය දක්වා මිඩ්ල්බ්‍රෝ පිල පැමිණ තිබූ අතර එහිදී පරාජය වී තිබුනේ ප්‍රබල ආසනල් පිල හමුවේය. 2004 වසරේ පළමු වරට පාපන්දු ලීග් කුසලාන දිනා ගෙන ඇත්තේද මැක්ලරන් යටතේ කණ්ඩායම පවතිද්දීය.

තවද මිඩ්ල් බ්‍රෝ කණ්ඩායමට යුරෝපීය අන්තර් ක්‍රීඩා සමාජ පාපන්දු තරගාවලියට පළමු වරට 2004 වසරේ දී එක්වීමේ අවස්ථා ලැබී ඇත්තේද ස්ටීව් මැක්ලරන්ගේ කැපවීම මතය.
මේ අනුව ඔහු පාපන්දු ක්‍රීඩකයෙකුට වඩා පුහුණුකරුවකු ලෙස හා කළමණාකරුවකු ලෙස කැපී පෙනෙන්නට සමත් වී ඇත. එබැවින් දැන් ඔහුට ලැබිය යුතු සුදුසු තැන ලැබී ඇති බව සඳහන් කළ හැකිය.
ඉදිරි කාලය මැක්ලරන්ට ඉතා කාර්ය බහුල විය හැකිය. සුදුසු සහය පුහුණුකරුවන් තෝරා ගැනීම පළමුවෙන් සිදුකළ යුතුව ඇත. එසේම එංගලන්ත පාපන්දු කණ්ඩායමට නව නායකයෙකු තෝරා ගැනීමද වහාම කළ යුතුය. ඉන් අනතුරුව අගෝස්තු 12 දා ඔහු යටතේ එංගලන්ත පිල සහභාගි වන පළමුවන අන්තර් ජාතික තරගයේදී ග්‍රීසියට මුහුණදෙන කණ්ඩායම තෝරා ගත යුතුය.

කෙසේ වුවත් එය සුහද තරගයක් බැවින් මැක්ලරන්ට ඉන් එතරම් බලපෑමක් එල්ල නොවන බව සැබෑය. එනමුත් ඔහුගේ වැඩි අවධානය යොමුවී ඇත්තේ 2008 වසරේ පැවැත්වෙන යුරෝපීය කුසලාන පාපන්දු තරගාවලිය සඳහා සුදුසුකම් ලබා ගැනීමට එංගලන්ත පිල සහභාගි වන තරග කෙරෙහි බව අමුතුවෙන් සඳහන් කිරීම අනවශ්‍යය.
එක් අතකින් ස්ටීව් මැක්ලරන් වාසනාවන්ත යයි සඳහන් කළ හැකිය. ඒ එම සුදුසුකම් ලබා ගැනීමේ තරගාවලියේදී එංගලන්ත පිලට ලැබී තිබෙන ප්‍රතිවාදී කණ්ඩායම් අභියෝගාත්මක නොවන බැවිනි.
ඇන්ඩෝරා, ක්‍රෝඒෂියාව, එස්ටෝනියාව, මැසිඩෝනියාව, රුසියාව හා ඊශ්‍රායලය එහිදී එංගලන්ත පිල හමුවන කණ්ඩායම්ය.
කරුණු එසේ වුවත් මෙම කණ්ඩායම් හමුවේ තරග වැදී කුමන හේතුවක් නිසා හෝ එංගලන්ත පිලට 2008 වසරේ පැවැත්වීමට නියමිත යුරෝපීය කුසලාන පාපන්දු තරගාවලියට එක්වීමේ අවස්ථාව ලබාගත නොහැකි වුවහොත් මැක්ලරන්ගේ අනාගතය අඳුරු වීමටද එය බලපෑ හැකිය. එසේ වුවහොත් වසර 4 ක කොන්ත්‍රාත්තුව ඊට බොහෝ කලින් අවසන් කිරීමට මැක්ලරන්ට සිදුවී වැලැක්විය නොහැක්කකි.
ස්ටීව් මැක්ලරන්ගේ ක්‍රීඩා භෞතික චිකිත්සක බ්‍රයන් බාර්වික් දැන් එංගලන්ත පාපන්දු සම්මේලනයේ ප්‍රධාන විධායක වරයාය. ඔහු මැක්ලරන්ගේ ආගමනය එංගලන්ත පාපන්දුවේ නව යුගය ලෙස හඳුන්වා ඇත.
හෙට දිනයේ ස්ටීව් මැක්ලරන් යටතේ එංගලන්ත පාපන්දු පිලේ නව නායකයා ලෙස ජෝන් ටෙරී, ස්ටීවන් ජෙරාඩ්, ග්‍රේ නෙවිලේ හෝ රියෝ ෆර්ඩිනන්ඩ් වැන්නන්ගෙන් කෙනෙකු පත්විය හැකිය. එහෙත් මේ හැම කෙනෙකුගේම අනාගතය රැඳී පවතින්නේ ලැබෙන තනතුරු මත නොව ඔවුනොවුන් සතුව ඇති කුසලතා දැක්වීමට සමත්වීමත් හා කුසලතා මතුකර ගැනීමට ඇති කුසලතාවන් මත බව සඳහන් කළ යුතුමය.

## MORE WORLD RECORDS




Sanath Jayasuriya made 152 for Sri Lanka against England at Headingley in the final ODI against England on July 1, 2006, and added 157 three days later against the Netherlands at Amstelveen. It was indeed the first time anyone had passed 150 in consecutive ODI appearances. The second one was Jayasuriya's fourth score of 150 or more in ODIs, which is indeed another record. Chris Gayle and Brian Lara have made three, as did Viv Richards (who also had a score of 149), while Sourav Ganguly, Herschelle Gibbs, Adam Gilchrist, Andrew Symonds and Sachin Tendulkar have all passed 150 twice. For a list of the highest individual scores in ODIs, click here.

# සනත්ගෙන් තවත් වාර්තා

බොහෝ දෙනෙකුගේ අවධානයට ලක් නොවුව ද පසුගිය නිමා වුණ එංගලන්ත හා නෙදර්ලන්ත චාරිකාවේදී සනත් ජයසූරිය නව ලෝක වාර්තා දෙකක් පිහිටෙව්වේ ය.
එංලන්තය සමඟ පැවති අවසන් තරගයේදී ඔහු ලකුණු 152 ක් රැස් කළ අතර ඉන්පසුව පැවති නෙදර්ලන්ත තරගයේදී ඔහු ලක-ණු 157 ක් රැස් කළේ ය. මේ තාක් කාලයක් ලෝකයේ කිසිම පිතිකරුවකු එක් දින තරග දෙකකදී පිට පිට ලකුණු 150 බැගින් වාර්තා කර නැත. එසේ කළ පළමු පිතිකරුවා සනත් ජයසූරිය යි.
නෙදර්ලන්තය ට එරෙහිව ලකුණු 157 ක් ලබා ගැනීමත් සමගම සනත් තවත් වාර්තාවක් පිහිටෙව්වේ ය. එනම් එක්දින තරග ඉතිහාසයේ වැඩිම වාර ගණනක් ලකුණු 150 ඉක්මවූ ක්‍රීඩකයා වීමයි. මෙයට පෙර ක්‍රිස් ගේල් හා බ්‍රයන් ලාරා අවස්ථා තුනකදී ලකුණු 150 ඉක්මවා ඇති අතර සව්රව් ගංගුලි හර්ෂල් ගිබ්ස් ඇඩම් ගිල්ක්‍රිස්ට් හා සචින් තෙන්ඩුල්කාර් යන ක්‍රීඩකයන් අවස්ථා දෙක බැගින් ලකුණු 150 ඉක්මවා ඇත.